

# කවුළුව

## යුගසර මෙහෙවර

හෙන්රි ඩී කුමාරප්පෙරුම
සිනුවර සිට



**'මලක මහිම බල අතු අග පිපීලා'**

කවුලු පියන් පත් ඇරිය මොහොතක්. එක් වර ම ඇස ගැසුනේ මඳ නළවැල් සිපිමින් සළිත වන සොබා දහමේ චමත්කාරය දනවන නිමැවුමක්. ඒ වෙනෙකක් නොව අතු අග පිපී ලෙලදුන් මලක්. කටු අතර වැඩී ගිය අතු අගෙහි නවාතැන් ගත් කහ රෝස මලක්.

සොබාදහමත් සමග නිතැතින් ම අප බැඳී වෙළී සිටින බව සිතට ආවෙ නිතැතින් ම වගේ. ජීවිතයේ කවර දේකටත් කවර අවස්ථාවකටත් සොබා දහමෙන් ලැබෙන රුකුල ගැන බිඳක් හෝ විමසීම වටියැයි බොහෝවිට සිතට ආවත් ඒ කෙරෙහි සිත යොමු කිරීම නුවමනාව හෝ අලසකම විසින් යටපත් කරනු ලැබුව. අලසකමත් එච්චරම හොඳ දෙයක් නෙහෙමයි. ඒත් ඒක සාමාන්‍ය දෙයක් කියල හිතෙනව. මොහොතක් පාසා සිත පුරා ගැවසෙමින් සැඟවී යන සිතුවිලි සමුදායෙන් ඉඳහිට හෝ ඉන් එකක් ගැන වත් විමසා බැලීම සතුටට කරුණක්. ඉන් තවත් එක් අයකු හෝ ලබන සංවේදී බව ද සතුටක්.

ඉහත කවි පාදය සීතාවක රාජසිංහ රජුගේ මුවෙන් ගිලිහුණු සෘංගාරාත්මක කවක එක් කවි පදයක්. රසවාදයේ එක් අංශයක් නියෝජනය කරමින් පළ කළ ඇමතුම් ඉඟියක්. රජුගේ සිතැඟි වටහා ගත් කතත් රස ජනන කාව්‍ය යෙන් ම පිළිතුරු සැපයීමට සමත් වීම කෙතරම් අගයක්ද? මල කොයි තරම් දේවලට සම්බන්ධද කියලත් හිතුන.

**මල හොඳ මොකද අතු අග පරවී යා නම්**

නිබය කවි කම ආවට ගියාට නැතිව සිතැඟි පළ කැරුමට ගම්බද කතකටත් තුබූ හැකියාව මින් පළ කෙරෙනව. පූර්ව රාගාත්මක; අභිලාශ, චින්තා ආදි රාග දශා වන් හා සම්මිශ්‍රිත විප්‍රලම්භ ශෘංගාරය සිත් සතන්හි දැනවූ අයුරුයි ඒ.

ගලක් මලක් ඇලක් වෙලක් හෝ වැස්සක් පින්නක් නිදාඝයක් මෙන් ම දිවා, නිසා, ප්‍රභාතයත්, කඳුගැටයත්, නිම්නයත්, වෙල් එළියත්, ඒ සිප එන සුළං රැලිත් අපේ එදිනෙදා කුඩු මහත් කටයුතු හා බැඳී පවතිනව. වෙනෙකක් තබා බමර සමනල විහග සිවුපා ආදී සත්ව සන්තතියේ විවිධ අවස්ථාත් මිනිස් දිවියට කවර හෝ ආකාරයකින් සම්බන්ධවී තිබීම විශ්මයාවහ බව පේනව. ජීවිතයක සරු නිසරු බව වෙනස් වීම සොබා දහමේ ගුණාගුණ හා වෙළී එකටම ගමන් ගන්නා බැවිනි.

ජීව සන්තතියේ වෙනස් කම් කෙරෙහි සොබාදහමේ බලපෑම මිනිසා වර්ගීකරණයට භාජනය කරනව. විශ්වය තුළට ගොනු කර ඇති සාදක විසින් විභේදනයට පත් කළ ජෛවී ස්භාවය; කලු සුදු විසින් ද, කුරු තර විසින් ද, සමානත්ව අසමානත්ව විසින් ද විවිධ කොට ඇත. එක ම මානව පර්ශදය දේශ දේශාන්තර වලදී මුහුණුවරින් හා කායික ස්රූපයෙන් වෙනස් කිරීමට ඇති සාදක වන්නේ කුමක්ද?. මේ සඳහා කලාපීය බලපෑමත් දේශගුණික විචලනයත් නොපෙනෙන කර්මය හා පෙනෙන සොබා දහමත් විසින් නිර්ණය කරනුලැබ ඇති බව පසක් කර ගැන්මට දර්ශනයෙනුත් පිටුවහලක් ලැබෙනව.

දර්ශනය ගැඹුරුයි. 'හක්ස්ලි' නමැති බටහිර දාර්ශනිකයා පැවසූවක් ගැන අසා ඇති කියමනක් මතක් වෙනව. ඒ පියදස්සි හිමියන්ගේ දහම් දෙසුමක ගැබ්වූවක්. එම පඬිවරයා වරක් පවසා ඇත්තේ එක ගඟකට මිනිසකුට දෙවරක් බසින්නට බැරි බවයි. ගඟ ගලා බසිනා බැවිනි. එම ගඟ මොහොතින් මොහොත වෙනස් වන බව ඔහු දැක ඇත.

ඒ බටහිර දර්ශනයයි. එහෙත් අනිත්‍යය පිළිබඳ කියැවෙන පෙරදිග බෞද්ධ දර්ශනයෙන් ඊටත් ගැඹුරු දෙයක් හෙළි කරනව. ඒ තමයි එක ගඟකට එක මිනිසකුට දෙවරක් බසින්නට බැරි බව. දිය බැස යන නිසා ගඟ වෙනස් වනවා සේ ම දෙවන වර ගඟට බසින මිනිසාත් වෙනස් වූ කෙනෙක්. ගඟ පමණක් නොව මිනිසාත් ක්ෂණයක් පාසා වෙනස් වන අයුරු ඔහු දැක නැති බවත් බෞද්ධ දර්ශනයේ ක්ෂණ භංගුරත්වය නැතිනම් හැම මොහොතක් පාසා හැම දෙයක් ම වෙනස් වීම ගැන කියැවෙන ගැඹුරු බවක් ඉන් පැහැදිළි කෙරෙනව.

කටු සහිත හෝ කටු රහිත, අතු අගක හෝ අතු පතරක පිපී ගත් මල කවදත් කාටත් නෙත් සිත් පිනවන දෙයක්. එහෙයින් එය බුදු සිරිපා අබියස පුදසුනක ඉතිරී කළ බැතිබර සළකුනක් වේ. විටෙක පිළි ගැනුමට ඉදිරියෙන් සිටී. තවත් විටෙක දාමයක් සේ ගෙළ පැළඳේ.

සුබ දායකත්වයට ඉදිරිපත් වන්නා සේ ම අසුබ අවස්ථාවේ ද වඩමක් ව සිටිමින් අනියත බව ද පහදනු ඇත. සොබාදහමේ අනඟි මැවුමක් වන මල මිනිසා බහ තෝරා ගන්නට පටන් ගත් දා සිටමත්, දරුවා ලොව හඳුනන්නට පටන්ගත් දා සිටමත් දුටු ප්‍රියංකරත්වය අද මතු නොව තවත් කල්ප ගණනක් එහාට ද යනු ඇත.

**හැඩ වැඩ කුමටද ඒ මත හිඳගෙන**
**මල නොතලා පැණි උරලා**
**ගුමු ගුමු නද දී සතුටින් යන්නම්**
**නුඹලට මල් රුව හිමි කරලා**

අත්තක පිපි මලකින් රොන් උරා යැපෙන්නට මීමැසි බමර සමනල් කැළට හැකිය. කටුවෙන් පැහැරුම් නොලැබ මල නොතලා රොන් ගැනුමට උන් හපන්නුය. මලේ පාට හැඩ රුව හා සුවඳ ලොවේ අන් අයට ඇවසියක් කර ගැන්මට ඉතිරි කර රොනින් පමණක් සෑහීමට උන් පෙළඹේ. සොබා දහම නිමැවූ මලෙන් උන් කුස ලත් සන්තර්පණය දවසක් ගෙවුමට රුකුලක් කොට සැළකුසේ ය. අතිරික්තය ද අන් වැඩ සඳහා මී පැණි බවට පත් කැරුමට වද වල පිරුවූ සැටි මනාය.

> **දර්ශනය ගැඹුරුයි. 'හක්ස්ලි' නමැති බටහිර දාර්ශනිකයා පැවසූවක් ගැන අසා ඇති කියමනක් මතක් වෙනව. ඒ පියදස්සි හිමියන්ගේ දහම් දෙසුමක ගැබ්වූවක්. එම පඬිවරයා වරක් පවසා ඇත්තේ එක ගඟකට මිනිසකුට දෙවරක් බසින්නට බැරි බවයි.**

එමතු ද නොව තමන් යැපුනා සේ ම ඒ මලේ වර්ණයෙන්, ගන්ධයෙන් හා හැඩයෙන් මුසපත් වීමට ප්‍රයෝජන ලැබීමට ලොවට ද ඉඩහැරීම කවර නම් ආශ්චර්යයක්ද? ගුණමකු ලොවටද මේ අබ ඇටයක්වත් තරම් මොළය යමක් පවසන්නේ? ඇත්ත එය විය යුතුයි.

ඇයි ගුණමකු කමක් ගැන කියන්නේ? උන් දකින්නට ඇති මිනිසා තල් මලෙන් , පොල් මලෙන් පැණි උරා බොන හැටි. දිග ගනන් මල කප කපා සැළි පුරා වෑහෙන තෙළිදියෙන් රා පෙරා, මීවිතෙන් මත් වන හැටි. සොබා දහම දුන් කප්රුකේ මල නසා, පල වරා මතු පරපුරට ද අහිමි කරන හැටි උන් සිත් නොගත් සැටියක්නොවේද ඒ පාඩමෙන් කියා දෙන්නේ?

**මලක මලෙකි - මහ පුදුමෙකි**
**නැහැ එහි සකි - සමනලයෙකි'**

මෙය මුනිදාස කුමාරතුංග පඬිවරයාණගේ සහසක් කවි ගී අතුරින් දරුවන් සඳහා ලියැවුන එකකි. මලක වැසූ සමනලයෙක් කුඩා ළමයෙක් දකින අයුරු මින් කියැවේ. මලක මලක් ඇති සැටි දකින කුඩාළමයා පුදුමයට පත්වෙයි.

හොඳ විපරමින් ඒ දෙස නැවත බලද්දී ඒ මල මත ඇත්තේ තවත් මලක් නොවන බවත් ඒ මලක් වන් සමනලයෙක් බවත් සැක හැර දැනගනී. ළමා මනසක මලත් සමනලයාත් පිළිබඳ ඇතිවන හැඟීම චමත්කාරත්වයෙන් පවසා ඇති සැටියි ඒ. මලට මලක් වන් සමනලයාගේ එක්වීමේදීත්; කිරි බඳුනකට ගොම බිඳක් එක්වීමේදීත් කෙතරම් වෙනසක් ඇති කරයිද?

කුමරතුඟු පඬිවරයා කුමර ගී වලින් තේරුම් බේරුම් කළේ කවිය ගීතය පමණක් ම නොවේ. ඒ තුළ පිහිටිය යුතු වියරණය මුල් කළ රස , භාව, අලංකාර, ගුණ, දෝෂ , යති, විරිත්, එළි වැට ආදී කාව්‍ය රීති ප්‍රතිපදාවයි.

වියරණය මුල් තන්හි ලා සෙසු කවි ළකුණු දෙවන තන්හි ලූයේ වියරණයෙන් තොර වූවක් බසට රැහැණි වන බැවිනි. ඉන් බස නොරැකෙන හෙයින්ම ය. ඒ බව පැවසූයේ මෙසේ ය.

**කවී මිනිසුගෙ පුවළ - අරුත පණ නල රස මොළ**
**සිරුර වෙයි පද වැළ - ලකර අබරණ කිමෙකැ එළි වැළ**

මහනෙල් මලක් අතින් ගෙන එහි සුගන්ධය ආඝ්‍රාණය කරන සීගිරි ළඳකගේ රුවින් සිත් පිනා යන සීගිරි රසිකයෝ එදා කැටපත් පවුර තල් පතක් කරලීමට සමත් වූහ. ඒ ඈත අතීතය ගැන තවමත් වර්ණනා මුඛයෙන් කථා කිරීමට ඔවුහු අපට බොහෝ දේ ඉතුරු කළහ. ඒ තුළ ගැබ්ව ඇත්තේ මනරම් ඉතිහාසයක වත ගොත ය. අනන්‍ය භාෂා සාහිත්‍ය ලක්ෂණ ය. අනුපමේය සංස්කෘතියක සුළ මුල ය. පරිනාමිත භාෂාවක මූල බීජ ය. අවිහිංසක කාලීන සංවාදයන් ය.

යුගයෙන් යුගය ගෙවී ගෙවී යතත් ඒ කාල වකවානු අපට යමක් ඉතුරු කර ඇති බව පෙනේ. අප අපගේ කාලය තුලින් ද හැකි යමක් මතු පරපුරට ඉතුරු කර තැබීම ඒ හා සමාන යුතු කමක් වනු ඇත. එය යුග මෙහෙවරේ දායකත්වයයි.

ඒ හා බැඳී ගිය ඉපැරණි කම හා ඉපැරණි දේ නූතන අනුභූතීන් කෙරෙහි බලපෑම සිදුවනුයේ කෙසේදැයි අපි මොහොතකටවත් සිතා බැලුවෙමුද? නූතන විසංවාදයනට ආවඩා පැරණි මං ඉවත ලමුද? පැරණි දේ මුදුනෙහි තබා නූතන සුසංවාද බැහැර කරමුද? 'නිස්සක් කෙරේ පැණවත්'.